මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 10වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පානදුර නගර දියුණුව පිළිබඳ වැඩ පිළිපාටිය සඳහා කොළඹ ගාළු මහපාරේ පානදුරේ 17වෙනි හැතැප්ම වෙනස් කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 17,562. ගම—උතුරු පට්ටිය.

| නො. | ඉඩමෙ නම. | | අන්දම. | අයිතිකමකියන්නා. | | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|---|---|
| 12 | දෙල්ගහවත්ත | .. | පොල් සහ ලිඳක් අඩංගු ඉඩම .. | ඩී. ඒ. අබේසේකර සහ තවත් අයෙක් | .. | 0 | 0 | 39·04 |
| 12A | වැලිපිටියවත්ත | .. | පොල් ඉඩම .. .. | ඩී. ජේ. ජයසුන්දර සහ තවත් අය | .. | 0 | 0 | 21·93 |
| 90 | එම | .. | පොල් සහ කානුවක කොටසක් අඩංගු ඉඩම | එම .. | .. | 0 | 0 | 9·53 |
| 90A | එම | .. | පොල්ගහක් සහ කානුවක කොට සක් | වී. එච්. ප්‍රනාන්දු .. | .. | 0 | 0 | 5·82 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1923ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පෙරවරු 10යේ කනිසමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිතුන් දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙමෙ ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල්ගණනත් ඊට ඇතතාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 6වෙනි
දින කළුතර කච්චේරියේදීය.

ඊ. ටී. මිලිංටන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පාතදුම්බර තිබෙන තෙල්දෙනියේ වහලඇල යන ඇල අලුත්වැඩියාකරණ පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියම 7,409. ගම—තෙල්දෙනිය.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වඩුගෙදරවත්ත | .. .. | වැසියන්නේවත්ත | .. | ඇල්. කිරිබන්ඩා | .. | 0 | 1 | 2·4 |

මුල් සිතියම 7,410. ගම—කුඹුක්කදුර.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | නම්මාවේදෙනියලාගේගෙදරවත්ත | .. | වැසියන්නේවත්ත | .. | ඇස්. අයිදුරුස් සහ තවත් අය | .. | 0 | 0 | 29·6 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1923ක්වූ පෙබරවාරි මස 2වෙනි දින පස්වරු 2යක් කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 5වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඇල්. කින්ඩර්ස්ලි,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—බෙන්තොට ස්වභාෂා පිරිමි පාඨශාලාවේ ළමයින්ට ක්‍රීඩා පැවැත්වීමට පිට්ටනියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 12,171. ගම—පහුරුමුල්ල.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | පල්ලියේවත්ත | .. | වත්ත | .. | (1) කේ. කේ. නිකුලස්, (2) ඒ. එච්. ඇස්. කරුනාරත්න මහතා, (3) ආර්. ඩබ්ලිව්. ඇස්. කරුනාරත්න, (4) ජේ. එච්. ඒකනායක, (5) නැන්සි ඒකනායක, (6) ලියනෝරා ඒකනායක සහ තවත් අයින් | 0 | 1 | 3·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1923ක්වූ පෙබරවාරි මස 9වෙනි දින පස්වරු 2යක් කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇතතාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 5වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

ඇෆ්. බාම්ලව්,
දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කොළඹ දැන්වීම නො. 8,247.]

### වර්ෂ 1897යේ, 1899යේ 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපනත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1923ක්වූ ජනවාරි මස 12වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ අතිරේක උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩම්වලට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම තමන් හෝ ලියවිල්ලකින් කියා නොසිටියහොත් එකී උපඒජන්ත උන්නාන්සේ විසින් ඉහතකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබී තිබෙන බලපූර්වන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජයන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇල්. ඇල්. හන්ටර්,
කොළඹ දිස්ත්‍රික්කුවේ ආණ්ඩුවේ අතිරේක උප ඒජන්නාන්සේ.

මෙම ඉඩම් මැදින් වැටීතිබෙන යම් පාරක් ගැන අයිතිවාසිකම් කියාසිටීම, මෙම ඉඩම්වලට අයිතිවාසිකම්කීම හා සමාන බවසැලකිය යුතුයි.

කියන්නේ මේ ඉඩම් ගැණයි.

මීට යාකරණලද සිතියම්වල* පෙනෙන බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ හේවාගම්කෝරළේ මැදපත්තුවේ පානලුව යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටි, එනම්:—

මුල් සිතියම 17,545.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | අග්ගොනෙහේන නොහොත් නබිරිත්තලන්ද | 3 | 2 | 17 |
| 2 | අග්ගොනෙහේන .. .. | 4 | 0 | 2 |
| 3 | එම (අඩිපාරලග තහනම්කරපු බිම්කට්ටිය) | 0 | 3 | 20 |
| 4 | අග්ගොනෙහේන .. .. | 3 | 3 | 10 |
| 5 | එම .. .. | 1 | 1 | 22 |
| 6 | එම .. .. | 2 | 0 | 19 |
| 9 | හතනගෙදෙනියලන්ද .. .. | 2 | 2 | 11 |
| 10 | නබිරිත්තලන්ද .. .. | 4 | 1 | 5 |
| 11 | පල්ලෙකුඹුර .. .. | 3 | 2 | 16 |
| 12 | පල්ලෙකුඹුර .. .. | 1 | 1 | 31 |
| 14 | පල්ලෙකුඹුරදෙනිය .. .. | 3 | 0 | 17 |
| 15 | ගල්වලමුල්ලෙලන්ද .. .. | 6 | 1 | 3 |
| 16 | එම .. .. | 8 | 0 | 6 |
| 17 | මාරියාපොලලන්ද නොහොත් නබිරිතතලන්ද | 6 | 1 | 13 |
| 18 | එම (ඉඩමට ඇතුල්වීමට පාරක්දැමීම පිණිස තහනම්කරපු කට්ටිය) .. .. | 0 | 0 | 18 |
| | | 51 | 2 | 10 |

මෙහි පහත සඳහන්වූ මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන බරව යන ඉඩම; නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින බරව සහ නතරදියද, ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින නාබිරිත්තලන්දද, ආණ්ඩුව විසින් අයිතිකම් කියාසිටින බරවද, ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින බරවාදෙනිය සහ මාරියාපොලකුඹුර යන ඉඩම්ද; දකුණට පිඹුරු කඩදාසි (නොම්මර) 297,015යේ පෙනෙන ඉඩමද, ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින හතනගේදෙනිය (මු. සි. 17,545/7), ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින ගල්වලමුල්ලෙලන්ද (මු. සි. 16,596/2), නොම්මර 319,514 දරණ පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම; බස්නාහිරට ආණ්ඩුව විසින් තහනම්කරපු අත්තනපොලලන්ද නොහොත් දෙනියායේලන්ද (මු. සි. 16,991/2), ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින අත්තනපොලලන්ද නොහොත් දෙනියායේලන්ද (මු. සි. 16,992/1), ජේ. ජයසූරිය විසින් අයිතිකම්කියාසිටින කහටගහවත්ත, ජේ. ජයසූරිය විසින් අයිතිකම්කියාසිටින අග්ගොනෙදෙනිය, ආණ්ඩුව විසින් අයිතිකම් කියාසිටින අග්ගොනෙදෙනිය, ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින අග්ගොනෙහේන, නොම්මර 321,581 දරණ පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම, ආණ්ඩුව විසින් තහනම්කරපු අග්ගොනෙහේන (මු. සි. 16,196/2), නොම්මර 291,291 දරණ පිඹුරු කඩදාසියේ පෙණෙන ඉඩම, ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින ගල්වලගොඩැල්ල (මු. සි. 17,545/13), නොම්මර 291,291 දරණ පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම, ඒ. බබප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින කොලනිකුඹුර සහ ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින බරව සහ ඇලනතරදිය.

II. කොටස. මුල් සිතියම 17,545.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 8 | .. හතනගේදෙනිය .. .. .. .. | 1 | 3 | 4 |

මෙහි පහත සඳහන්වූ මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින හතනගෙදෙනිය (මු. සි. 17,545/7); නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින හතනගේදෙනිය (මු. සි. 17,545/7), නොම්මර 297,015 දරණ පිඹුරුකඩදාසියේ පෙණෙන ඉඩම; දකුණට ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින මිරිවතුමුකලාන, (මු. සි. 16,596/3); බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින මිරිස්වතුමුකලාන (මු. සි. 16,596/3) සහ ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින ගල්වලමුල්ලෙලන්ද (මු. සි. 16,596/2).

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 28—29වෙනි පිටුවල ප්ලෑන් බලනු.

---

(9වෙනි පිටහා සම්බන්ධයි.)

### වර්ෂ 1893යේ ගව ඝාතනය කරන්නන් සම්බන්ධ ආඥාපනත.

වර්ෂ 1893යේ 9වෙනි ආඥාපණතේ 23වෙනි වගන්තිය යටතේ සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1910යේ සැප්තැම්බර් මස 23වෙනි දින සහ නො. 6,403 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිඩකර තිබෙන යටියන්තොට ගවයන් මරන මඩුව සම්බන්ධව සාදනලද පහත සඳහන් ව්‍යවස්ථාවන් කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව වැඩබලන ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනුලැබ මහාජනයාගේ දැනගැනීම සඳහා ප්‍රසිඩකරනු ලැබේ.

වර්ෂ 1911යේ මැයි මස 11වෙනි දින සහ නො. 6,440 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිඩකළ 1911 මැයි මස 8වෙනි දින දරණ අතුරුපණත් මෙයින් අවලංගුකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 8වෙනි දින කොළඹ
මහලේකම්තුමන්ගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්වම්හ.

සඳහන්කරනලද ව්‍යවස්ථාවල්.

1. පෙරවරු 6යේ සිට 7ත දක්වා කාලය තුළ මිස වෙන කොයිම වේලාවකවත් ගවයන් මරන මඩුවේ කිසිම සතෙකු නොමැරිය යුතුයි.

2. මැරීමට පූර්ව ගවයන් 24 පැයක් දක්ෂිණය පිණිස තැබීමට නියමකර තිබෙන ස්ථානයනම් යටියන්තොට ටවුමේ තිබෙන "හරක් ගාල" නම් ස්ථානයයි.

3. ගවයන් මැරීමට අවසරලත් අය විසින් මරනු කැමති ගවයා හෝ බැටළුවා හෝ එළුවා පරීක්ෂාකිරීම සඳහා පෙරවරු 8ට දිස්ත්‍රික් වෛද්‍ය මූලාදෘනිතැන ඉදිරියේ පෙන්නා සිටිය යුතුයි. දිස්ත්‍රික් වෛද්‍ය මූලාදෘනිතැන විසින් ගවයාගේ කුවිතන්සියේ එම ගවයාගේ සනීපවත්කම ගැන සහ මනුෂ්‍ය ආහාරයට මැරීමට සෑහේද නොසෑහේද යන්න ගැනද ඔහුගේ කල්පනාව සඳහන්කළ යුතුයි. තවද බැටළුවන් හෝ එළුවන් නම් මැරීමට ලියනලද අවසරපත්‍රයක් දියයුතුයි.

4. යම් සතෙක් මරනුලැබූ පසු උගේ මාංසය රෝගීව හෝ මනුෂ්‍ය ආහාරයට නුසුදුසු බව පෙනේනම් සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර්තැන විසින් එය දිස්ත්‍රික් වෛද්‍ය මූලාදෘනිතැනට දන්වා දිස්ත්‍රික් වෛද්‍ය මූලාදෘනිතැන්ගේ කල්පනාවේ හැටියට ඒ මස් මනුෂ්‍ය ආහාරයට නුසුදුසු නම් එය වහාම වළලාදැමීමට සලස්වා කෑගල්ල දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේට ඒ කාරණාව රපෝර්තුකළ යුතුයි.

5. මරනලද සතුන්ගේ මස් ඒ දවසේම හම ගසා ශුද්ධකළාට පසු එය එල්ලීමට සපයා තිබෙන කාමරයේ එල්ලාතැබිය යුතුයි. තවද අවසර ඇතුව මිස පෙරවරු 8වෙනතුරු විකිණීම පිණිස මස් ගෙනයන්ට බැරිය.

6. ගවයන් මරණ මඩුව පාවිච්චිකරන්නාවූ සෑම ගවයින් මරන්නන් නොහොත් සෑම අන්‍ය අයවලුන් විසින් පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුයි :—

මරන මඩුවේ ගාස්තු.—1. එක ගවයෙකුට ශත 50යි.
2. බැටළුවෙකුට හෝ එළුවෙකුට ශත 25යි.

7. සියලු ගාස්තු සනීපාරක්ෂක සභාවේ ඉන්ස්පැක්ටර්තැනට අත්පිට ගෙවියයුතුයි.

8. සතෙක් මරා අවසානවූ වහාම මඩුවද ඒ අවටද ශුද්ධකර සියලුම ලේ, බඩවැල් යනාදිය වළලා නොහොත් වළලවා දැමීම ගවයින් මරන්නා විසින් කළයුතුයි. මෙකී යුතුකම් සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර්තැනගේ නියමයන් අනුව කළයුතු වන්නේය.

9. ගවයින් මරණ මඩුවේ තවත් සතුන් ඉදිරිපිට සිටියදී හෝ කලින් මරනලද සතෙකුගේ මස් ඉවත්කරනතුරු හෝ මුවාකර ස්ථානය ශුද්ධකර මිස තවත් සතෙකු මැරීම තහනම්ය.

---

වර්ෂ 1893නේ 9වෙනි ආඥාපණතේ 23වෙනි වගන්තිය යටතේ සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1912නේ ඔක්තෝබර් මස 4වෙනි දින සහ නො. 6,525 දරණ ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධකර තිබෙන දෙහිඕවිට ගවයන් මරන මඩුව සම්බන්ධව සාදනලද පහත සඳහන් ව්‍යවස්ථාවන් කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව වැඩබලන ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනුලැබ මහජනයාගේ දැනගැන්ම සඳහා ප්‍රසිද්ධකරනු ලැබේ.

වර්ෂ 1913නේ අප්‍රේල් මස 25වෙනි දින සහ නො. 6,559 දරන ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධකළ 1913නේ අප්‍රේල් මස 17වෙනි දින දරන අතුරුපණත් මෙයින් අවලංගු කරනුලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 8වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සඳහන්කරනලද ව්‍යවස්ථාවල්.

1. පෙරවරු 6යේ සිට 7 දක්වා කාලය තුළ මිස වෙන කොයිම වේලාවකවත් ගවයන් මරන මඩුවේ කිසිම සතෙකු නොමැරිය යුතුයි.

2. මැරීමට ප්‍රථම ගවයන් 24 පැයක් දශීණය පිණිස තැබීමට නියමකර තිබෙන ස්ථානය නම් ගල්ලැලිපිටියහේනේ පිහිටා තිබෙන "හරක් ගාල" නම් ගොඩනැගිල්ල වේ.

3. ගවයන් මැරීමට අවසරලත් අය විසින් මරනුකැමති ගවයා හෝ බැටළුවා හෝ එළුවා පරීක්ෂාකිරීම සඳහා පෙරවරු 8ට දිස්ත්‍රික් වෛද්‍යමූලාදෘනිතැන ඉදිරියේ පෙන්නා සිටිය යුතුයි. දිස්ත්‍රික් වෛද්‍යමූලාදෘනිතැන විසින් ගවයාගේ කුවිතන්සියේ එම ගවයාගේ සනීපවත්කම ගැන සහ මනුෂ්‍යආහාරයට මැරීමට සෑහේද නොසෑහේද යන්න ගැනද ඔහුගේ කල්පනාව සඳහන් කළයුතුයි. තවද බැටළුවන් හෝ එළුවන්නම් මැරීමට ලියනලද අවසරපත්‍රයක් දියයුතුයි.

4. යම් සතෙක් මරනුලැබූ පසු උගේ මාංසය රෝගීව හෝ මනුෂ්‍ය ආහාරයට නුසුදුසු බව පෙනේනම් සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර් තැන විසින් එය දිස්ත්‍රික් වෛද්‍යමූලාදෘනිතැනට දන්වා දිස්ත්‍රික් වෛද්‍යමූලාදෘනිතැනගේ කල්පනාවේ හැටියට ඒ මස් මනුෂ්‍ය ආහාරයට නුසුදුසුනම් එය වහාම වළලාදැමීමට සලස්වා කෑගල්ල දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේට ඒ කාරණාව රපෝර්තු කළයුතුයි.

5. මරනලද සතුන්ගේ මස් ඒ දවසේම හමගසා ශුද්ධකළාට පසු එය එල්ලීමට සපයා තිබෙන කාමරයේ එල්ලා තැබිය යුතුයි. තවද අවසර ඇතුව මිස පෙරවරු 8 වෙනතුරු විකිණීම පිණිස මස් ගෙනයන්ට බැරිය.

6. ගවයන් මරන මඩුව පාවිච්චිකරන්නාවූ සෑම ගවයින් මරන්නන් නොහොත් සෑම අන්‍ය අයවලුන් විසින් පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුයි: —

මරන මඩුවේ ගාස්තු.—1. එක ගවයෙකුට ශත 50යි. 2. බැටළුවෙකුට හෝ එළුවෙකුට ශත 25යි.

7. සියලු ගාස්තු සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර්තැනට අත්පිට ගෙවිය යුතුයි.

8. සතෙක් මරා අවසානවූ වහාම මඩුවද ඒ අවටද ශුද්ධකර සියලුම ලේ බඩවැල් යනාදිය වළලා නොහොත් වළලවා දැමීම හරක් මරන්නා විසින් කළයුතුයි. මෙකී යුතුකම් සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර්තැනගේ නියමයන් අනුව කළයුතු වන්නේය.

9. ගවයන් මරන මඩුවේ තවත් සතුන් ඉදිරිපිට සිටියදී හෝ කලින් මරනලද සතෙකුගේ මස් ඉවත්කරනතුරු හෝ මුවාකර ස්ථානය ශුද්ධකර මිස තවත් සතෙකු මැරීම තහනම්ය.

---

වර්ෂ 1921කේ නොම්මර 20 දරන ආඥාපණතේ ප්‍රකාර අමුතුකරනලද වර්ෂ 1892කේ නොම්මර 18වේ ආඥාපණතේ 9වෙනි (E) (2) වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කේ සනීපාරක්ෂක සභාව විසින් සාදනලද මෙහි පහත සඳහන් අතුරුපණත් කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව වැඩබලන ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලදින් පොදු ජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනුලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 8වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

1. ප්‍රථමකොට සභාපතිතැනගෙන් ලියවිල්ලක්පිට ලබනලද අවසරයක් නොමැතිව ඉඩම් හිමියෙකුට හෝ පදින්චිකාරයෙකුට ඔහුගේ ඉඩමේ හෝ ගේඅවට ප්‍රදේශයෙහි කිසිම විධියේ වැසිකිළියක් තැනීම හෝ තනවන්ටසැලැස්වීම නුපුළුවන.

2. (a) පළමුවෙනි උපනීතියේ ප්‍රකාර එවැනි අවසරයක් ලබාගැණීම පිණිස ඉල්ලුම්පත්‍රයක් යැවූකල්හි සභාව විසින් පිළිගන්නාලද යම් විශෙෂක්‍රමයේ වැසිකිළියක්මිස අන්‍ය ක්‍රමයේ වැසිකිළියක් නොතැනීමට බලකිරීමට සභාපතිතැනට හෝ සභාවට බලය තිබේ.

(b) තවද සභාපතිතැන හෝ සභාව එවැනි වැසිකිළියක් සෑදීමට සුදුසු ස්ථානයක් නියමකරනවා ඇත. තවද කිසිම වැසිකිළියක් අන්‍ය ස්ථානයක තැනීමට අවසරදීම ප්‍රතික්ෂෙපකරනවා ඇත.

(c) සනීපආරක්ෂක ක්‍රමයන් අනුව එවැනි ඉදිකිරීමකට අවසර නොදීම සෑහේයයි සභාපතිතැනට හෝ සභාවට කල්පනා වන්නේනම් යම්කිසි ඉඩමක යම්කිසි වැසිකිළියක් තැනීමට අවසරදීම සහමුලින්ම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට හෝ සභාවට වැඩුරවත් බලය තිබේ.

3. (*a*) අවසර නොමැතිව හෝ සභාපතිතැන විසින් හෝ සභාව විසින් නිකුත්කරනලද යම් අවසර පත්‍රයක ඇති වගන්තිවලට විරුඬව හෝ සාදනලද වැසිකිළියක් පිහිටා තිබෙන යම් ඉඩමක හිමිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය සභාපතිතැන විසින් හෝ සභාව විසින් නියමකරනු ලබන සෑහෙන කාලයක්තුළදී බිඳහෙලා වසාදැමීමට ලියවිල්ලකින් අණකිරීමට සභාවට හෝ සභාපතිතැනට බලයතිබේ.

(*b*) (*a*) යන උප වගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම කඩකරන්නාවූ යම් කෙනෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

4. (*a*) සභාවෙන් නියමකරන ආකාර එවැනි ක්‍රමයේ හෝ ප්‍රමාණයේ වැසිකිළියක් අසවල් ස්ථානයෙහි ඊට සම්බන්ධවූ කරුණුත් ඇතිව අණෙව් නියමකරන කාලයක්තුළදී ඉදිකිරීම පිණිස ඉඩම් හිමියාට හෝ පදිංචිකාරයාට සභාව විසින් අණ කරනු ලැබේ.

(*b*) (*a*) යන උපවගන්තියේ ප්‍රකාරකරණලද අණක් ඉෂ්ටකිරීම පැහැර අරින්නාවූ යම්කෙනෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

5. (*a*) යම් වැසිකිළියක් පිහිටා තිබෙන්නාවූ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය සභාවෙන් නියමවන කාලයක්තුළදී සහ එම ප්‍රකාරයටත් අලුත්වැඩියා කිරීමට හෝ වෙනස්කිරීමට හෝ නැවත තැනීමටද නැතහොත් නියමකරනලද කාලයක්තුළදී බිඳහෙළා වසාදැමීමටද ලියවිල්ලකින් අණකරන්ට සභාවට පුළුවන. එසේ කරන්නේ සභාවේ කල්පනාවේ හැටියට එවැනි වැසිකිළියක් ඉදිකිරීම්ශාස්ත්‍රයේ හැටියට වරද සහිතනම් එක්කෝ එය පාවිච්චිකරණ කාරණාවට අයෝග්‍යනම් එක්කෝ එයින් අසනීපයක් හටගන්න පුළුවන්නම් එක්කෝ 8වෙනි අතුරුපණතේ ප්‍රකාර හෝ වෙන විධියකින් සභාව විසින් තනන ලද සනීප ආරක්ෂක අතුපාරක (මුඩුක්කු) නිසියාකාර පිහිටා නොමැත්තේද, එය පහසුලෙස ශුඬකිරීමට නොහැක්කේද, එම වැසිකිළිය පිහිටාතිබෙන්නාවූ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට සභාවෙන් නියමවන්නාවූ ආකාරයට සහ නිසි කාලයක්තුළදී එම වැසිකිළිය අලුත්වැඩියාකිරීමට හෝ වෙනස්කිරීමට හෝ නැවත සෑදීමට හෝ කඩා වසා දැමීමට ලියවිල්ලකින් අණකිරීමට සභාවට පුළුවන.

(*b*) (*a*) යන උපවගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම පැහැරඅරින්නාවූ යමෙක් ඇද්ද ඔහුවරදක් කළාවේ.

වචනවල තේරුම.

6. පහත දක්වන අතුරුපණත්වල අදහස් පිණිස:—"වැසිකිළිය" යන්නෙන් වියලි පස් දමන්ට බාල්දි තබා සාදන ක්‍රමයේ වැසිකිළි හැර අනිකුත් සියලුම ක්‍රමයේ වැසිකිළි හඟවනවත් හැර ඇතුළත්වේ.

"විශෙෂයෙන් නියමකරනලද භූමිභාගය" යන්නෙන් කලින් කලට සභාව විසින් විශෙෂයෙන් නියමකරනු ලබන්නාවූද, සභාවේ සීමාව තුළ පිහිටියාවූද, එවැනි භූමිප්‍රදෙශයක් හෝ ප්‍රදෙශ හඟවනවත්හැර ඇතුළත්වේ. එවැනි භූමිප්‍රදෙශයව එකී සීමාතුළ පිහිටි සියලුම භූමිය හෝ එයින් කොටසක් හෝ කොටස් ඇතුළත්වේ.

7. විශෙෂයෙන් නියමකරනලද භූමිභාගයක හෝ විශෙෂයෙන් නියමකරනලද භූමිභාගයක කොටසක පිහිටියාවූ ඕනෑම වගීයේ යම් විශෙෂ ක්‍රමයක වැසිකිළියක් පාවිච්චිකිරීම තහනම්කිරීමටද සියලුම වැසිකිළි බාල්දි තබා සාදන වියලි පස් දැමීමේ ක්‍රමය අනුව සෑදීමට නියමකිරීමටද සභා සම්මතය පිට පිළිවන්කම තිබේ.

8. වැසිකිළියක් හෝ වැසිකිළි පිහිටා තිබෙන ගෙයක හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය හෝ වැසිකිළි වසාදමා ඒ වෙනුවට බාල්දි තබා සාදන වියලි පස් දමන ක්‍රමයේ වැසිකිළියක් හෝ වැසිකිළි තැනීම පිණිස සභාව විසින් ස්ථිරකරනලද යෝජනාවක් පිට ලියවිල්ලකින් දැන්වීමක් කරනුලැබූකල්හි එවැනි දැන්වීම භාරදීමේදී සභාව විසින් නියමකරනුලබන කාලය තුළ එම දැන්වීමේ ප්‍රකාර ක්‍රියාකිරීම එම අයගේ හෝ අයවලුන්ගේ තද යුතුකමක්වේ.

එවැනි දැන්වීමක තිබෙන කරුණු ඉෂ්ටකිරීම කඩකරන්නාවූ ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා අපරාධයක් කිරීමේ වරද කාරයෙක්වේ. තවද මේ අතුරුපණතේ ප්‍රකාර යම් වැසිකිළියක් තැනීම උවමනා කල්හි එය මොන වගීයේ එකක්ද එය පිහිටන ස්ථානය කොයේද යනාදිය ගැන උවමනා කාරණා කියාදීම සභාපතිතැනට හැකිවනසේ 1 (පළමු)වෙනි අතුරුපණතේ ප්‍රකාර සභාපතිතැනගෙන් අවසරගැනීම උවමනාවේ.

9. යම් වැසිකිළියක් පිහිටාතිබෙන ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එම වැසිකිළිය යහපත් අන්දමට සහ ශුඬලෙසටද සනීපාරක්ෂක පිළිවෙලටද තැබීම සහ එයින් අසනීපයක් හටනොගන්නලෙස බලාගැනීමත් ඔහුගේ යුතුකමක්වේ.

එසේ කිරීම කඩකරන්නාවූ යම්කිසි ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් අපරාධයක් කිරීමේ වරදකාරයෙක්වන්නේය.

10. අසූචි ඉවතගෙනයාම යහපත්සේ කෙරෙන පිණිස ඔවුන්ගේ ඉඩම් මැදින් හෝ පිටිපසින් අඩි 8කට වැඩිනොවන වැසිකිළි ශුඬකිරීමේ අතුපාරක් සභාපතිතැන කියන ආකාර ඔවුන්ගේම වියදමින් සෑදීමට සහ එය පැවැත්වීමටත් විශෙෂයෙන් නියමකරනලද භූමිභාගයක පිහිටි ගෙවල් හෝ ගොඩනැගිලි හෝ ඉඩම් අයිතිකාරයාට හෝ එහි පදිංචිකාරයාට සභා සම්මතයෙන් කියාසිටීම නීතිසහගතවේ.

11. යම්කිසි විශෙෂ භූමිභාගයක් ශුඬකිරීමේ කටයුතු සියල්ලම සභාව විසින් කරනුලැබේ. තවද සභාපතිතැනගෙන් අවසරයක් නොමැතිව යම් කෙනෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් සිටින කෙනෙකු විසින් හෝ ඔහුගේ මෙහෙකරුවෙකු විසින් එවැනි වැඩකිරීම නීතියට විරුඬවේ. එම භූමිභාගය තුළ එවැනි වැඩ සියල්ලම සභාව මගින්ම හොඳකාර කරවීම හැකියයි සභාපතිතැනට කල්පනාවේනම් එවැනි අවසරයක් දීම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට බලය තිබේ.

12. අසූචි ඉවත්කිරීම පිණිස සභාව විසින් නියමකරනුලබන්නාවූ ගාස්තු විශෙෂ භූමිභාගයක වැසිකිළි අයිතිකාරයන් හෝ පදිංචිකාරයන් විසින් මාස්පතා සභාවට ගෙවිය යුතුයි. එවැනි ගාස්තු එම මෙහෙය කළාවූ මාසය ළඟ මාසයේ දහවෙනි දිනට ප්‍රථමයෙන් ගෙවිය යුතුයි. එවැනි ගාස්තු සභාව විසින් නියමකරනලද කාලයතුළදී නොගෙවා පැහැර අරින්නාවූ යම් කෙනෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

13. දිනපතා කුලීකාරයන්ගේ මෙහෙය උවමනාකරන ඇත්තන් විසින් ලියවිල්ලකින් සභාවෙන් ඉල්ලුම්කළ යුතුයි. තවද එම කුලීකාරයෝ සභාවෙන් ස්ථිරකරන ගෙවීමක්පිට සපයනු ලැබෙත්.

14. විශෙෂ භූමිභාගයකින් පිටතවාසය කරන්නාවූ අයෙක් ඔහුගේ වැසිකිළිය ශුඬකිරීම සභාවට භාරදීමට හෝ දිනපතා කුලීකාරයෙකුගෙන් වැඩගැනීමට කැමැත්තේනම්, ඒ බව ලියවිල්ලකින් සභාපතිතැනට දැනුම්දිය යුතුයි. එවිට සභාව විසින් එම කෘත්‍යයකිරීම සභාව විසින් ස්ථිරකරන ගෙවීමක්පිට භාරගන්නවා ඇත.

15. අලුත් කුණු වළක් සෑදීම හෝ පවතින්නාවූ කුණු වළක් වෙනස්කිරීම හෝ අලුත්වැඩියාකිරීම හෝ නැවත සෑදීම හෝ වසාදැමීම උවමනායයි සභාව කල්පනාකළවිටක අලුත් කුණුවළක් සෑදීමට හෝ වෙනස්කිරීමට හෝ අලුත්වැඩියාකිරීමට හෝ නැවතත් සෑදීමට හෝ පවතින්නාවූ කුණුවළක් වසාදැමීමට යම්කිසි ඉඩම් අයිතිකාරයෙකුට හෝ පදිංචිකාරයෙකුට සභාපතිතැන විසින් අත්සන්කරනලද ලියවිල්ලකින් දැන්වීමක් කිරීමට සභාවට හැකිය. තවද එවැනි කුණුවළක් පිහිටන ස්ථානයද එහි මට්ටම සහ ප්‍රමාණයද එය සෑදීමට ගතයුතු උපකරණද වැඩේකළයුතු අන්දම සහ එවැනි වැඩ සම්බන්ධවූ අනිකුත් විස්තර කාරණාද ගැන කරුණු දන්වනවා ඇත. එවැනි දැන්වීමක් ලැබුණුපසු සභාවෙන් නියමිත කාලය තුළදී සභාව විසින් උවමනාකරනලද කාරණා ඉෂ්ටකිරීම පැහැර අරින්නාවූ යම් ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් අපරාධයක්කිරීමේ වරදකාරයෙක් වෙනවා ඇත.

16. කුණුවතුර ගලාගොස් එක්කාසුවෙන වළක්ඇති යම් ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එවැනි වතුර දිනපතා ඉවත්කිරීම සභාව විසින් කරනුලබනබව සභාපතිතැන විසින් දැනුම්දීම නීතිප්‍රකාරයුතුවේ. එම කුණුවතුර ඉවත්කිරීම පිණිස සභාව විසින් නියමකරනුලබන යෝග්‍යවූ ගාස්තු ගෙවීමට ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා බැඳිසිටියි.

17. කුණුවතුර ගලාගෙන එක්වන්නාවූ යම් වළක් පිහිටි ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා 16වෙනි අතුරුපණත් ප්‍රකාර සභාපතිතැන විසින් දැනුම්දෙනු නොලැබුවේනම් එම ජලයෙන් බාධාවක් හටනොගන්නා හැටියට සභාපතිතැන විසින් නියමකරනුලබන ස්ථානයකට එම ජලය ඉවත්කිරීම ගැන වගකිය යුතුයි. යම් ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් ඉහතකී ප්‍රකාර එවැනි කුණුවතුර ඉවත්කිරීම කඩකළොත් ඔහු අපරාධයක්කිරීමේ වරදකාරයෙකු වන්නේය.

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

මෙහි පහත සඳහන්වෙන ගාළු දිසාවේ දොඩන්ගොඩ මිනිසුන් එතරකරණ තොටුපල් රේන්දය වර්ෂ 1923ක්වූ පෙබරවාරි මස 1වෙනි දින පටන් දෙසැම්බර් මස 31වෙනි දින දක්වා ආණ්ඩුවෙන් බදු ගැණීමට එවනලද මුද්‍රලත් ඉල්ළුම්පත්‍ර ගාල්ලේ රෝඩ්කොමිටියේ ප්‍රධානතුමා විසින් භාරගනුලැබේ.

2. මතුකී මුද්‍රලත් ඉල්ළුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්වලෝප උඩ Tender for Dodangoda Toll Rents "දොඩන්ගොඩ තොටුපල සඳහා ඉල්ලුම්පත්‍රය" යන වාක්‍යගම ඇතුව වර්ෂ 1923ක්වූ ජනවාරි මස 29වෙනි සඳුදා පස්වරු 2ක වනතුරු ගාල්ලේ කච්චේරියේදී භාරගනු ලැබේ. එවිට ඒවායේ මුද්‍ර කඩාබලනවා ඇත. තවද ඉල්ලුම්පත්‍ර දී සිටින සැම්දෙනාම ඉදිරිපිටට ඇවිත් නැතහොත් තමන් විසින් වෙන අයෙකුට නිසි බලයක්දී ඔහු ඒවා හෝ ඒ දෙනලද ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඇත්තේ ඒවා බවට ප්‍රධානතුමාට ඒත්තුගන්වන්ට ඕනෑය.

සතුටුදායක ඉල්ලුම්පත්‍රයක් ලැබුනේ නැත්නම් යම් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර නිෂ්ප්‍රභාකිරීමේ අයිතිවාසිකම් ප්‍රධානතුමාට තබාගන්නාලදී. තවද සෑහෙන ඉල්ලුම්පත්‍රයක් නොලද්දේනම් එදිනම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ප්‍රධානතුමාට පුලුවන්වේ.

3. ප්‍රධානතුමා විසින් තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දහයෙන් කොටසකට වැටහෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණකුත් නොව දැනුම්දුන් දින පටන් 30 දවසකදී එම ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට ඇප මුදලෙන් හෝ සල්ලිවලින් තුනෙන්පංගුවක් හෝ ගෙවියයුතුයි.

4. මුදලෙන් ඇප සම්පූර්ණකරනවානම් විකිණීම දවසේ ඇපේට තබන්ට ගෙදුන දහයෙන් කොටසට වැටහෙන මුදල අවුරුද්දේ අන්තිම භාරමාසේට ගෙවියයුතු මුදලෙන් කොටසක්හැටියට භාරගනුලැබේ. වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් සම්පූර්ණකරනවානම් ඉහතකී දහයෙන් කොටසක් රේන්දේ මුදල් ප්‍රවේසමට ප්‍රධානතුමා තබාගන්නට යෙදෙනවා ඇත.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රිජිස්ටර්කිරීමට ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්නට ඕනෑය.

6. ගැනුම්කාරයා විසින් රේන්දපලේ පාරේ දෙපැත්තේ යාර 100ක් දුර පෙනෙන රතු එළි දෙකක් තබන්ට ඕනෑය.

7. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගතයුතුයි. මෙම සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරියයුතුයි.

මේ ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ළුම්කළවිට දැනගන්ට පුළුවන.

ඇෆ්. බාව්ලව්,
ගාළු පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 6වෙනි දින ගාල්ලේ
දිස්ත්‍රික් රෝඩ්කොමිටි කන්තෝරුවේදීය.

උඩප්පුවේ ලුණු ඉස්ටෝරුව අළුත්වැඩියාකෙරීමටද ඉස්ටෝර්කිපර් උන්නැහෙගේ බංගලාව අළුත්වැඩියාකෙරීමට සහ පැට්‍රෝල්කාරයින්ට ගෙවල් දෙකක් සෑදීමටද ඉල්ළුම්පත්‍ර බාරගනුලැබේ.

2. ඉල්ළුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලෝප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලෝප් එකේ වම්පැත්තේ කොණේ මින් පහත සඳහන් වාක්‍යගම ලියා තියෙන්ට ඕනෑය. එනම්, "උඩප්පුවේ ලුණු ඉස්ටෝරුවද ඉස්ටෝර්කිපර්ගේ බංගලාව අළුත්වැඩියාකෙරීම සහ පැට්‍රෝල් ගෙවල් 2ක් සෑදීමට ඉල්ළුම්පත්‍රයයි" තවද ඉල්ළුම්පත්‍රය වර්ෂ 1923ක්වූ ජනවාරි මස 22වෙනි දින පස්වරු 1ට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලන්ට අදහස්කරණ තැනැත්තා ඉල්ළුම්පත්‍රය එවන්ට ප්‍රථමයෙන් කොයිම කච්චේරියක හරි "ටැන්ඩර් පෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක් බඳින්ට ඕනෑය. එසේ බැඳ ලබාගත් රිසිට්එක ඉල්ළුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. යම් ඉල්ළුම්කාරයෙකුගේ ඉල්ළුම්පත්‍රය බාරගත්කල්හි එම ඉල්ලුම්කාරයා භාරගත්වැඩේ සතුටුදායක අන්දමකට කරදෙන පිණිස උප ඒජන්ත උන්නාන්සේ සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙන්ට එකී රුපියල් (10) ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. එවැනි කොන්ත්‍රාත්තුවකට සෑහෙන කාලයක් ඇතුළතදී බැඳෙන්ට නොයෙදුනොත්, එම මුදල රජසන්තක කරනුලැබේ.

5. ඉල්ළුම්කාරයාට පුත්තලමේදී ලියුම් ලැබෙන නොහොත් ලියුම් දෙන්ට ඇඩ්‍රස් එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්එකට ඇතුල්වී සුමාන හතරක් ඇතුළතදී වැඩේකර ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර තොරතුරු පුත්තලමේ ලුණු ඉන්ස්පැක්ටර් තුමාගෙන් දැනගන්ට පුළුවන.

### කරන්ට තිබෙන වැඩවල විස්තර.

දැනට ගොඩනැගිලිවල තිබෙන්නාවූ සියලුම දිරච්ච නොහොත් වෙනයම් විදියකට පාවිච්චිකරන්ට බැරි පොල්අතු ලීදඬු යනාදිය අහක්කර ඒවා වෙනුවට අළුත් ඒවා දමන්ට ඕනෑය.

ඉස්ටෝරුවේද, ඉස්ටෝර්කිපර්ගේ බංගලාවේ සහ කුස්සියේත් වහලවල් අළුත් පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය. බර වෙනුවට එම වහලවල්උඩ මාංගු දමන්ට ඕනෑය.

එකගෙට අඩි 10×12 දිග පළල ඇති කාමර දෙක බැගින් ගොඩනැගිලි දෙකක් සාදන්ට ඕනෑය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
උප ඒජන්තත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 8වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

## නඩුපොත් පුළුස්සාදැමීම සම්බන්ධ දැන්වීමයි.

මෙවක්පටන් තුන්මාසයක් ගතවුනායින්පසු වර්ෂ 1894රේ අවුරුද්දේ අංක 12 දරණ ආඥාපණතේ ප්‍රකාර මෙහි පහත දක්වන ලේඛණයේ පෙණෙන නඩු පුළුස්සාදමන බව මෙයින් දැනුම්දෙමි.

යම් කෙනෙකුට මෙයින් නඩුපොතක් ගැණ වැදගත්කමක් ඇත්නම් එය පුළුස්සා නොදමා නවත්වාගැණීමට සෑහෙන කාරණ පෙන්වා තමාම අත්සන් තබනලද පෙත්සමකින් හෝ පෙරකදෝරු කෙනෙකුගේ මාර්ගයෙන් ඉල්ළුම්කළ යුතුයි.

ඉහතකී ලේඛණයයි.

පොලිස් උසාවියේ වර්ෂ 1917 ජනවාරි මස 1වෙනි දින සිට, 1917 දෙසැම්බර් මස 31වෙනි දින දක්වා පමුණුවනුලැබූ නඩු සම්බන්ධ පොත්වේ.

ජේ. වැන්ඩන්බර්ග්,
පොලිස් නඩුකාරතැන.

වර්ෂ 1923ක්වූ ජනවාරි මස 6වෙනි
දින රත්නපුරේ පොලිස් උසාවියේදීය.

H. R. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.